# පැරැණි ලක්දිව ආගමික පසුබිම පිළිබඳ සද්ධර්මාලංකාරය ආශ්‍රිත අධ්‍යයනය

එච්. ඒ. ගිහාන් මධුසංඛ

Saddarmalankara, written by Jayabahu Thero Buddhism scriptures the second is the largest Sinhalese banakatha book written in Gampola era. This book is an exposition of the decaying prose Sinhalese, is not of a very high status as far as its literary value is concerned. This prose work, where an adaptive writing style mainly based on Pali Rasavahini can be seen, is of significant value when it comes to the study of traditional Sri Lankan society. A number of religious aspects of medieval Sri Lanka can be identified in it. Accordingly, it is revealed that there were a number of Mahayana Buddhist concepts prevailing in the then society in addition the mainstream Theravada concept. Further, other religious concepts are also enunciated to this prose work. On the other hand, it provides historical records of the contribution of the values regarding the religious intervention of the era. This study is an analysis of the above concepts.

ගම්පොළ සාහිත්‍ය අවධියේ ලියැවුණු සද්ධර්මාලංකාරය, ද්විතීය ධර්මකීර්ති නම් බෞද්ධ භික්ෂුවක විසින් රචනා කරන ලද ධර්ම කථා සංග්‍රහයකි. අනුරාධපුර අවධියට අයත් යැයි සැලකෙන පාලි කෘතියක් වන රසවාහිනිය ප්‍රධාන මූලාශ්‍රය කර ගෙන ධර්ම දේශනා ඔස්සේ පුද්ගල චිත්ත සන්තානය දානාදී පුණ්‍යක්‍රියායෙහි ව්‍යාවෘත කරනු පිණිස රචනා වූ කෘතියක් ලෙස සද්ධර්මාලංකාරය හැඳින්විය හැකි ය. බෞද්ධ භික්ෂුවකගේ රචනයක් බැවින් කෘතියෙන් ඉදිරිපත් වන ආගමික දෘෂ්ටිය ඉඳුරා මධ්‍යස්ථ වූවක් යැයි පැවසීම

© කථිකාචාර්ය එච්. ඒ. ගිහාන් මධුසංඛ

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය



පූර්ණ සත්‍යයක් නොවේ. සමස්ත කෘතිය කෙරේ අවධානය යොමු කිරීමේ දී තත් අවධියේ ලාංකේය ජන සමාජයේ පැවැති සාමයික පසුබිම පිළිබඳ පැහැදිලි ප්‍රතිරූපයක් ගොඩනඟා ගැනීමට තරම් පොහොනා බවක් ඉන් දිස් වෙයි.

ගම්පොළ අවධියේ ලක්දිව පැවැති සමාජයීය ලක්ෂණ විෂයයෙහි අවධානය යොමු කරන හරිස්චන්ද්‍ර අබයරත්න; ථෙරවාද, මහායාන හා හින්දු දේව විශ්වාස සම්මිශ්‍රණය වූ ආගමික පසුබිමක් පැවැති අතර ඊට සමකාලීන සමාජ දේශපාලනික තත්ත්වය බලපෑ බවත් එකී ආගමික මතවාද සියල්ල ථෙරවාද පදනමකට යටත් ව පැවැති බවත් පවසයි.[1] මේ ප්‍රකාශය සද්ධර්මාලංකාරය සමග සැසඳීමේ දී කෘතියේ තේමාව හා ඓන්ද්‍රිය ස්වරූපයෙන් බද්ධ ව ඇති බුදුසමයත් කාල වශයෙන් ඊට සමගාමී ව ලක්දිව පැවැති වෙනත් ආගම්වල ක්‍රියාකාරීත්වයත් හඳුනා ගත හැකි ය. මධ්‍යතන අවධියේ ලංකා සමාජය අධ්‍යයනයට උපස්ථම්භක කර ගැනෙන සෙසු මූලාශ්‍රය කිහිපයක් සමග සද්ධර්මාලංකාරය සැසඳීමෙන් තත් අවධියේ ලක්දිව ආගමික ස්වරූපය මෙහි දී පරීක්ෂාවට ලක් වෙයි. තත් කෘතියේ ප්‍රධාන වශයෙන් බුදුසමය හා ඒ වටා බැඳුණු සාමයික ස්වරූපයක් දක්නට ලැබෙයි. එමෙන් ම ලක්දිව පැවැති අවශේෂ ආගම් පිළිබඳ ව ද සද්ධර්මාලංකාරයේ දැක්වෙයි. ප්‍රධාන ආගමික සංස්ථාවකට අයත් නොවූ ප්‍රාථමික අභිචාර පද්ධතියක් ද මෙහි ක්‍රියාත්මක වූ බවක් හඳුනා ගත හැකියි.

## ථේරවාද බුදුසමය

ආර්යයාගමනයට පූර්වයෙහි බුදුරදුන් තෙවරක් ලක්දිව වැඩම කළේ යැයි වංශකථාවේ කියැවේ[2]. දෙවනපෑතිස් රජු බෞද්ධ භික්ෂුවක ප්‍රථම වතාවට දුටු ආකාරය සද්ධර්මාලංකාරයේ සඳහන් වන්නේ මෙසේ ය.

> "මේ ජින්න භින්න පටධර වූ කාෂාය වස්ත්‍රය හැඳ පෙරෙව්
> හිස මුඬු තෙනැත්තේ"[3]

මහින්දාගමනයෙන් පසු ලක්දිව බොහෝ රජවරුන්ගේ ප්‍රධාන අනුශාසකයා බවට පත් වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලායි.

දෙවනපෑතිස් රජු මිහිඳු මහතෙරුන්ගේ අවවාද පිළිගෙන කටයුතු කළේ යැයි සද්ධර්මාලංකාරයේ සඳහන් වේ. බුදු සමය පිළිගෙන ක්‍රියා කරන්නට වූ රජවරු ඊට සිය අනුග්‍රහය සපයමින් දහම බැබළවීමට ක්‍රියා කළහ. ශාසන මාමක රජුන් කෙරෙහි ඉමහත් ලැදියාවකින් යුතු ව වර්ණනාත්මක ශෛලියෙන් සඳහන් කිරීමට ඉතිහාසය ලියා තැබූ භික්ෂූහු උත්සුක වූහ. මහාවංශයේ බුද්ධාගම දියුණු කළ රජවරුන් හා ඊට පටහැනි ව ක්‍රියා කළ රජුන් හැඳින්වීමට යොදන ගුණවාචක පද ඇසුරින් ද ඒ බැව් පෙනෙයි. සද්ධර්මාලංකාර කතුවරයා දුටුගැමුණු රජු බුදුසමයට කළ අනුග්‍රහයන් අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට ප්‍රියතාවක් දක්වා ඇත. දුටුගැමුණු ධර්ම දේශකයන්ට අනුග්‍රහ කළේ ය.

"එතැන් පටන් ලංකාද්වීපයෙහි සියලු විහාරවල තමන් නමින් බණ පවත්නා ලෙස ධර්ම කථිකයන්ට නොයෙක් සත්කාර කොට එකී එකී ධර්මකථිකයන් හට නැලියක් පමණ ගිතෙල්, මී, උක් සකුරු ද සතරඟුලක් දිග මහ වැල් මී ගැටයක් ද වස් සාර පෝයෙහි එකී එකී පිළිසඟලක් ද භාණ්ඩාගාරයෙන්ම දී"[4]

බෞද්ධ විහාරස්ථානයක පැවති විහාරාංග වශයෙන් දාගැබ්, මහබෝ, ප්‍රතිමාගෘහ, ධර්මශාලා, සක්මන් මණ්ඩප, රත්වත්, සුළුපා, මහපා ආදිය දැක්වේ.[5] බුද්ධ ශාසනයට කළ යුතු අනුග්‍රහයන් අතර, සිව් දිගින් වඩින මහා සංඝයා උදෙසා ධර්මය පිහිටි තුන්බෝධි සහිත විහාරයක ආවාසයක් කරවා දීම අසංඛ්‍ය විපාක ලැබෙන්නක් වශයෙන් දක්වා ඇත. එය බුදුපාමොක් මහ සඟනට දන් දීමටත් වඩා වැඩි පිනකි.[6] භික්ෂු සංඝයාට වාසය කිරීම සඳහා ප්‍රමාණවත් ආවාසයන් විහාරාරාමවල නොවූ බවක් මේ ප්‍රකාශයෙන් හැඟේ. පරසතුරු හා ස්වභාවික උපද්‍රවයන්ගෙන් වන හානි මීට බලපාන්නට ඇත.

පසේ බුදුවරයන් වහන්සේලා ගැන පුවත් සද්ධර්මාලංකාරයේ, සද්ධර්මරත්නාවලියේ සුලභ ය. සද්ධර්මාලංකාරයේ තේභාතික වර්ගයේ දී උන්වහන්සේලාගේ ස්වභාවය ගැන මෙසේ දක්වා ඇත.

"ඒ ප්‍රත්‍යෙක බුද්ධවරයෝ නම් හිමවත ගන්ධමාන පර්වතයෙහි වෙසෙති. හිස මුඩුය. කාෂාය වස්ත්‍ර පෙරවගෙන කුල ගෙවල භික්ෂාටනය කොට ඇවිදිති. ඉතා ශාන්ත දාන්තයහ. සිල්වත් ගුණවත්හ"[7]



බෞද්ධ භික්ෂූහු දුර්භික්‍ෂ සමයේ සිය දිවි පරදුවට තබා ත්‍රිපිටකය සජ්ඣායනා කරමින් එය රැක ගත්හ. සේදූ වන ම පාත්‍රා රැගෙන ආපසු වැඩි භික්ෂූන්ගෙන් අනාවරණය වන්නේ ප්‍රත්‍ය ලාභයේ ප්‍රහීන භාවයයි.

ධර්මකථා සාහිත්‍යයේ එන පුවත් බොහොමයක පුණ්‍යවන්තයා සුගතිගාමී වීම සිදු වන අතර ම පාපතරයා අපායගාමී වීම හෝ දුක්ඛ මරණයකට පත්වීමෙන් ඉරණම විසඳේ. සද්ධර්මාලංකාරයේ දී මේ ලක්ෂණය වෙනස් වන අවස්ථා හමුවේ. ආරඤ්ඤක අභය ස්ථවිර වස්තුවේ භික්ෂූන් වහන්සේගේ සිවුරු සොරකම් කළ හරන්තික නම් චෞරයා බෞද්ධ භික්ෂුවක බවට පත් වී අර්හත්වය සාක්ෂාත් කළේ ය. බෞද්ධ භික්ෂූන් වහන්සේලා සාමාන්‍ය ජනතාවට බෙහෙවින් සමීප ව සිටියහ. බුදුසමය ජනප්‍රිය වීමට එය ඉවහල් වන්නට ඇත.

ජනයා සුශික්ෂිත හා සදාචාර සම්පන්න කිරීම උදෙසා පුනර්භව සංකල්පය උපයෝගී කර ගැනීම බෞද්ධ භික්ෂූන් වෙතින් සිදු විය. සද්ධර්මාලංකාරයේ නොයෙක් අවස්ථාවල දී තෘෂ්ණාවේ ආදීනව දක්වනු පිණිසත් දන් දීමේ ආනිසංස හැඟවීමටත් උක්ත සංකල්පය උපයෝගී වී ඇත.

"මෙසේ එම ජන්මයෙහි අන්‍යව්‍යසනයට පමුණුවා මතු ජාතියෙත් ගව, බලු, ගරිඩි, මැඩි, හූරු ආදී වූ හීන තිරිසන් යෝනියෙහි උපදවමින් අපමණ දුකට පමුණුවන්නාවූ ක්ෂේත්‍ර වස්තූන් හා පුත්‍රදාරාදීන් කෙරෙහි ද මුතු මැණික් ආදී වූ දශවිධ රත්නයෙහි ද ලෝභ වශයෙන් පවත්නාවූ තෘෂ්ණාව ක්ෂය කළ කල්හි."[8]

ආර්යවංශ ධර්ම දේශනා වසරක් පාසා පවත්වමින් ද තුන්යම් රැය මුළුල්ලෙහි ධර්මදේශනා පවත්වමින් ද විහාරස්ථාන, උත්සවශ්‍රීයක් අත්පත් කර ගෙන තිබුණු බවක් පෙනෙයි. සමසකට වරක් ආර්යවංශ සූත්‍ර දේශනාව පැවැත්වූ විහාරස්ථාන ගැන ද දැක්වේ.[9] ආර්යවංශ සූත්‍ර දේශනය ලංකාවේ විහාරාශ්‍රිත ව පැවති වැදගත් උත්සවයකි. ඒ පිළිබඳ ශිලාලේඛනමය සාක්ෂ්‍ය ක්‍රි. ව 3 සියවසේ පමණ සිට හමු වන අතර මහාවංශයට අනුව වෝහාරතිස්ස රජු රට පුරා ආර්යවංශ සූත්‍ර දේශනා

පැවැත්වී ය.[10] බණ ඇසීමට පැමිණි පිරිස් නානච්ඡන්දික ව දසදික් බලමින් වික්ෂිප්ත ව බණ ඇසූ බව ධර්ම සංග්‍රහ වර්ගයේ දැක්වේ.[11] ධර්මශ්‍රවණය පිණිස විහාරස්ථානයට පැමිණිය ද නෛර්යානික මාර්ගය ගැන තැකීමක් සාමාන්‍ය ජනයාට නොවී ය. ඔවුන් ගෙදරදොර දහසකුත් වැඩ රාජකාරි ගැන එහි දී ද සිතන්නට ඇත. සමාජයීය වාතාවරණය සැකසී තිබුණේ ආගමික ශික්ෂණය ඔස්සේ සසර කෙටි කර ගැනීමේ චින්තනය කරා මෙහෙයවීමට නොව ගෘහවාසයේ ඒකාකාරීත්වයෙන් මිදෙනු වස් ආගම් ඇදහීමේ ක්‍රමයකට ය.

ලක් බුදුසසුනේ භික්ෂුණී ශාසනය ද ව්‍යාප්ත ව තිබිණි. අනුලා දේවිය ඇතුළු දහසක් ස්ත්‍රීහු සංඝමිත්තා තෙරණිය කෙරෙහි මහණ ව රහත් වූහ. ධර්මකීර්ති හිමි තමා අයත් භික්ෂු සංස්ථාවේ වුව දුබලතා වෙතොත් ඒවා පක්ෂපාතීත්වයෙන් තොර ව විවේචනය කළේ ය. ධර්මසංග්‍රහ වර්ගයේ එන පිළිවෙත් කඩ කොට අන්‍යවිහිත ව බණ අසා හීන ගාන්ධර්ව කුලයක උපන් භික්ෂු දෙනමකට කරන උපහාසාත්මක අවවාදයෙන් ඒ බව පෙනී යයි. බණ ඇසිය යුතු පිළිවෙළ ද එමගින් පසක් කර දෙයි.[12]

ලක් රජුන් සිය දිවිය හා බැඳුණු මංගල සම්මත අවස්ථාවන්හි භික්ෂූන් වහන්සේලා වඩම්වා මහදන් පැවැත්වූ බව සඳහන් වේ. ගැමුණු හා තිස්ස කුමරුවන්ගේ බත් කවන, කන් විදින, කෙස් බහන, මඟුල් අවස්ථාවල දී කාවන්තිස්ස රජතුමා රහතුන් පන්සියය බැගින් වඩම්වා මහදන් පැවැත්වී ය.[13] දුම්බිට්ඨී මහරජු කරවූ ගිරිභණ්ඩු පූජාවක් ගැන අඞ්ඤතරකුමාරිකා වස්තුවේ එයි. මහදාඨික මහානාග රජු මිහින්තලා අම්භස්තල චෛත්‍යයේ වැඩ නිමවා මෙබඳු පූජාවක් කළේ ය.[14]

අතීත ලංකාවේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ධර්මයේ සඳහන් ඇතැම් දුරවබෝධ කරුණු අරභයා වාද විවාද කළ සැටියෙකි. පර්යාප්ති, ප්‍රතිපත්ති ධර්ම අතරින් ශාසනයට මූලික වනුයේ කුමක් දැයි තෝරා ගැනීම උදෙසා හටගත් එබඳු වාදයක් ගැන කෘතියේ දැක්වේ. ඉන් පර්යාප්ති ධර්මයේ පක්ෂය ගත් පිරිස ජය ගෙන ඇත. අධිගම ලෝභයෙන් යුතු ව බුදු සසුනේ කමටහන් වඩා හැසිර, විශේෂ අධිගමයක් ලැබිය නොහැකි වූයෙන් බුද්ධ ශාසනය නෛර්යානික නොවේ යැයි වැරදි දෘෂ්ටි උපදවා ගත් තැනැත්තෙකු ගැන වාචකාල උපාසකයාගේ කථාවේ සඳහන් වේ.[15]



> "ඉදින් මිථ්‍යාදෘෂ්ටි ගත් රජෙක් කිසි කලෙක ලක්දිව බලාත්කාරයෙන් ගෙන රාජ්‍ය කෙළේ වී නමුදු ඔහුගේ වංශ ප්‍රතිෂ්ඨාව නොවනු බුදුන්ගේ ම ආනුභාව විශේෂයක්මය"[16]

රාජ්‍යත්වය ලැබීම සඳහා බෞද්ධයකු වීම අනිවාර්ය සුදුසුකමක් සේ සලකා ඇත. ලක්දිව රාජ්‍යත්වය කෙරෙහි බුදුසමයෙන් ලත් ප්‍රබල බලපෑම මේ ප්‍රකාශයෙන් පෙනී යයි.

එක් ජන වර්ගයක් යටත් කර ගැනීමට තවත් ජන වර්ගයක් සූදානම් වීමේ දී යටත් වාසීන්ගේ ආගමට අයත් පූජනීය වස්තු විනාශ කර දැමීමට පෙළඹේ. මේ ඉරණම ද්‍රවිඩ ආක්‍රමණවලට නතු වූ ලංකාවේ ථෙරවාද බුදු සමයට ද අත් වූ බවට ඓතිහාසික ලේඛනාරූඪ සාක්ෂ්‍ය ඇත. ඒ පිළිබඳ සද්ධර්මාලංකාරයේ ද පුන පුනා සඳහන් වේ.

> "පළමු ධර්ම රාජ්‍යයයි යන ලංකාද්වීපයෙහි බෝධිවරුන් වහන්සේ දෙමළු දූන් කපා නැති කෙරෙති. ඒ ඒ තෙන දාගබ් පිළිම ආදිය සිඳ බිඳ නසති"[17]

> පිළිම ගෙවල් බුද්ධ රූප සිඳබිඳ හෙළා ඒ ඒ තැන දාගැබ් මහබෝ නසා පොත්පත් ගිනිලා භික්ෂු භික්ෂුණීන් වහන්සේගේ කයට සිතට දුක් පමුණුවා පාත්‍රා කුඩ සිඳ බිඳ දමා[18]

බෞද්ධ අභිචාරාත්මක ලක්ෂණ හා ජන විශ්වාසයන් දේශීය ජන සමාජයෙන් විද්‍යමාන වූ ආකාරය ද කෘතියේ දැක්වෙයි.

### 1. දානය

බුද්ධ දේශනාවේ සඳහන් වන අන්දමට ත්‍රිවිධ පුණ්‍යක්‍රියා අතරින් පළමු වැන්න දානයයි. එය බෞද්ධ සදාචාර දර්ශනයේ පදනමයි. ගිහි බෞද්ධයන් පිළිගන්වන දානයෙන් භික්ෂුව යැපෙයි. ආහාර හිඟයෙන් පීඩිත වූ ජන සමාජයක දායකයන් අහරින් පිරිහෙත් ම ඔවුන්ගෙන් යැපුණු ප්‍රතිග්‍රාහක භික්ෂූන් ප්‍රත්‍ය ලාභයෙන් පිරිහී යාම වැළැක්විය නොහැක. මේ හේතුව පාදක කරගනිමින් දානානිසංස ආවර්ජනා කිරීම සඳහා දෘෂ්ටාන්ත කථා උපයෝගි කර ගැනීම සිදු ව ඇත. මාර්ටින් වික්‍රමසිංහට අනුව;

> "භික්ෂූන්ට සපයන ලද ප්‍රණීත ආහාරවල නම් වට්ටෝරුවක් සතරවන සියවසෙහි කරන ලද තෝණිගල සෙල්ලිපියෙහි සඳහන් වෙයි. සද්ධර්මාලංකාරයෙහි ඇතැම් කථා වස්තුවල සඳහන් වන්නේ පැවිද්දන් එවැනි ආහාරයෙන් සංග්‍රහ ලැබූ අවධියක තොරතුරු නොව කර කොලයෙන් යන්තම් පණ ගැට ගසා ගෙන ජීවත් වුවන්ගේ තොරතුරු ය."[19]

දන් දෙනු පිණිස සැදැහැතියන් පෙළඹවීම මේ කථා මගින් සිදු ව ඇත. දානය කෙරේ සිත් සතන් ඇලවීම උදෙසා මහත් උත්සාහයක් ගන්නා කතුවරයා එහි වටිනාකම නිරන්තර පිරිවහන මන්ත්‍රයක් සේ ඉදිරිපත් කරයි.

> "මේ දානය නම් මනුෂ්‍යයන්ට රක්‍ෂා ස්ථානයෙක; සියලු දුර්ගති භය වළකන්නේ ය. දෙව්ලොවට නැඟෙන හිණක් වැන්නේ ය. අතිශය ශාන්ති ඵලවයි. නිවන් සම්පත් හස්තගත කෙරෙයි"[20]

සිල්වතුන් උදෙසා ම දන් දිය යුතු යැයි අවසානයේ සඳහන් කරයි. දන් දීමේ දී අනුගමනය කළ විශේෂ සිරිතක් දේව ස්ථවිර වස්තුවේ එයි. නිරාහාර වෘක්ෂ දේවතාවෙකුට බත් ආලෝපයක් දන් දීමට භික්ෂු නමක් පෙළඹුණේ ය. ප්‍රතිග්‍රාහක වූ රුක් දෙවියා කම්පල අදහා ගනිමින් එය ආපසු එම තෙරුන් වහන්සේට ම පිළිගැන්වී ය.[21] ජයම්පතිකා වස්තුවේ සංසදත්තාව සිය දාන තේජසින් ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු කළා ය.[22]

දරිද්‍රතාවෙන් පීඩිත සමාජයක ගුණ ධර්ම හෝ දානාදී පිංකම් හෝ බලාපොරොත්තු විය නොහේ. දන්පින් කිරීම සඳහා,

1. වස්තුව අතිරික්තයක් පැවතීම
2. ආගමික චින්තනය ඔස්සේ කෙරෙන පෙළඹවීම
3. සංසාරගත (බෞද්ධ අදහස) හුරුවක් පැවැතීම.

යන කරුණු බලපෑම් කරයි. පළමුවැන්න හා තෙවැන්න දුර්ලභ වූ යුගයක ආගමික චින්තනය ඔස්සේ දානය සඳහා දිළිඳු ජනයා පෙළඹවීම සිදු වේ. දන්පින් කළවුන් මතු ලබන්නා වූ විපුල සම්පත්ති සම්භාරයක් පිළිබඳ දෘෂ්ටාන්ත කථා අවැසි වන්නේ ඒ සඳහායි.



> "ගැමියෙකු තම දුව විකුට ගත් මුදල පමණක් නොව ඒ දුව වහලින් මුදනු පිණිස බැල කොට සපයා ගත් මුදල ද පරලොව සුව පතා වියදම් කරනු පිණිස ඔහු පොළඹවන්නට තමන්ගේ බණ දෙසුම් සකස් කළහ"[23]

යනුවෙන් වික්‍රමසිංහ සද්ධර්මාලංකාරයේ කතාකලාව දන් පිදීම අරභයා සකස් වීම ගැන චෝදනා කරයි. කතුවරයා ස්වල්ප මාත්‍ර වූ දානයෙහි පවා විපුල ඵලවිපාක දක්වීමට පෙළඹී ඇත්තේ කාලීන සමාජාර්ථික අර්බුදවල බලපෑමෙන් බව පෙනෙයි. අගහිඟකම්වලින් යුතු ජනයා බහුල වූ බැවින් එවන් අදහසක් ඉදිරිපත් කිරීම බෙහෙවින් වාසි දායක වන්නට ඇත.

## 2. දිව්‍ය ලෝක සම්පත්

බුදුසමයේ පරම නිෂ්ඨාව ලෙස දක්වෙන්නේ නිර්වාණ අබෝධයයි. 'නිර්වාණාවබෝධයට ප්‍රථමයෙන් සදිව්‍යලෝකයන්හි හැසිර දිව සැපත් විඳ ගත යුතු ය' යන ආකල්පය මධ්‍යකාලීන ජන සමාජයේ පැවතුණකි. මනුෂ්‍ය ජීවිත ලබා යුද කෝලාහල, දුර්භික්ෂාදී ව්‍යසනයන්ට මුහුණ පාමින් දුක්ඛිත දිවි පෙවෙතක් ගත කළ සාමාන්‍ය ජනයා සැපවත් ජීවිතයක් මතු භවයේ හෝ ලබා ගැනීමට ප්‍රාර්ථනා කිරීම වරදක් ලෙස සැලකිය නොහේ. සද්ධර්මාලංකාරයේ දෙව්ලෝ සම්පත් ගැන බහුල ව තොරතුරු ඉදිරිපත් කරන්නේ භවතණ්හාව උපදවා හෝ පින් කිරීම පිණිස ජනයා මෙහෙයවීමේ අභිලාෂයෙනි.

බුදුරදුන්ට විළඳ දන් දී දෙව්ලොව ලාජ නම් දෙව්දුව බවට පත්වූ ස්ත්‍රියකි.[24] සගමොක් සැප ප්‍රාර්ථනා කිරීම ධර්ම දේශනා අවසානයේ සිදු විය. අන් කිසිත් කුසලයක් නොකළ ද ශ්‍රී සද්ධර්මය සිත් හෙළා ඇසීමෙන් ස්වර්ග මෝක්ෂ සැප ලැබෙතැයි කරන සඳහන සමස්ත කෘතියේ ම දැකිය හැකි ය. සිල් රකිනවුන් දෙව් ලොව උපදින අතර ධ්‍යානලාභීන් බඹලොව උපදිති'යි කියැවේ.[25] බූමාටු දෙවියන් දුර්භික්ෂ සමයේ විහාරස්ථාන කරා ගොස් අහර සුඟක් ඉල්වා එයින් යැපුණු බව කියැවේ. කරකොළ කමින් දුකසේ දිවි ගෙවූ වෘක්ෂදේවතාවකු ගැන සඳහන් වේ. ඒවායින් ප්‍රකාශ කිරීමට උත්සහ දරා ඇත්තේ දෘඪ පුණ්‍ය සම්භාරයන් එක්රැස් කර ගත යුතු බවයි.

පින් කරන්නවුන්ගේ ප්‍රාර්ථනය වූයේ; **"බොහෝ කුශල සම්භාරයන් රැස් කොට දෙව්ලොවට නැඟී දිව්‍ය ප්‍රසාදයෙහි**

**වෙසෙමින් ප්‍රමාණාතික්‍රාන්ත වූ දිව්‍ය සම්පත් වළඳා අති ශාන්ත වූ නිවන් පුරයටත් පැමිණෙන්නාහුම ය**”යන්නයි. දෙව් මිනිස් සැප කෙලවර අමාමහ නිවන් ප්‍රාර්ථනා කිරීමේ ක්‍රමය වර්තමානයේ ද දැක ගත හැකි ය. දන් පින් කරන්නවුන් පිළිබඳ පුවත් දෙව් ලොවට සැළවේ ය යන විශ්වාසය ජන සම්මත ව පැවැත්තේ ය. ගෝළ උපාසකයා අමතා සක්දෙවිඳු පැවසුවේ,

“තොප දන පින් කෙරෙතියි යන කීර්ති ඝෝෂාව සියලුදෙව්
ලොව එක හෙළා පැතිර ගියේ වේදැයි” යනුවෙනි.

### 3. බුදුසමය හා බැඳුණු වෙනත් ජන විශ්වාස

කෘතියේ අවස්ථා රැසක සත්‍යක්‍රියා බලයෙන් සිදු කරනු ලැබූ විස්මිත ක්‍රියා දැක්වේ. අයහපත් දේ කරන අධාර්මික සමාජයක, යහපත කරන පුද්ගලයා ගැන ගෞරවයක් පැවතුණි. යහපත් ලෙස ජීවත් වන, ධර්ම ශ්‍රවණාදී පුණ්‍යක්‍රියායෙහි නියැළෙන පිරිස් තම ජීවිතයේ සිදු කළ එවැනි සත් ක්‍රියාවක් ආවර්ජනා කොට එහි සත්‍යානුභාවයෙන් තමන් වෙත එළැඹි උවදුරු දුරු කර ගැනීමට උත්සුක වූහ. පාදපීඨිකා වස්තුව, කාංචනදේවී වස්තුව, ධම්ම සවනෝපාසිකා වස්තුව, කුඩ්ඩරජ්ජ වස්තුව එබඳු සත්‍යක්‍රියාවලින් සාර්ථක ප්‍රතිඵල ලැබූ ආකාරය කියැවෙන කථා වස්තූන් ය.

පැරණි ලක්දිව ප්‍රකට ජනකථා, බණකථා අච්චුවෙහි බහා පුනර් නිෂ්පාදනයක් සේ ඉදිරිපත් කිරීමට කතුවරයා පෙළඹී ඇති සැටියෙකි. මීට සදාශ්‍රය ලත් මුල් කෘති අනුරාධපුර අවධියට අයත් ඒවා ය. එකල රජරට ප්‍රකට ව තිබූ මිථ්‍යා විශ්වාස හා ජන විශ්වාස සද්ධර්මාලංකාරයේ නොයෙක් අවස්ථාවල කථා රසයෙන් අනූන කොට ඉදිරිපත් කර ඇත. අඩු නොවන බත් සැළිය පිළිබඳ ජන විශ්වාසය එබන්දකි. එය අඩු නොවන සළු පිළි මංජුසාවක්, සා මස් සැළියක්, බෙහෙත් කැඳ බඳුනක් ලෙසින් විවිධ අවස්ථාවන්හි සුදුසු පරිද්දෙන් පෙර කියන ලද ආගමික අච්චුවෙහි බහා ඉදිරිපත් කරයි. මිනිසුන් අල්පභෝගීත්වය යටතේ ප්‍රාර්ථනා කළේ නොසිඳෙන සැපතක් බව සිහි කටයුතු ය. ග්‍රාමදාරිකා වස්තුවේ නියං සමයේ කෙත මැද පහළ වූ පැන් පොකුණ ද එබන්දකි.[26]



බෝමළු ඇමදි කුශලයෙන් යහපත් වූ රූප සම්පත් ලැබූ අශෝකමාලාව සාලිරාජ කුමරුගේ මෙහෙසිය වූයේ යැයි පැවසේ. එය කාලීන ජන විඥ්ඥාණයේ බුදු සමයේ ආභාසය ඇති ව පැතිර තිබූ විශ්වාසයකි. **බොහෝ කුසල් කළා වූ සත්ත්වයනට මරණ වේදනාවක් නැත්ම ය යන විශ්වාසය** ද[27] බෞද්ධාගමික පසුබිමක ගොඩනැගුණකි. තිස්සා නම් දිළිදු දාසිය සිතන්නී,

“පෙර ජාතියෙහිත් පිනක් නොකළ හෙයින් දැන් දුප්පත් වුණුම්හ.
දැනුත් පිනක් නොකළමෝ නම් මතුත් මෙසේම දුප්පත් වම්හ”[28]

ආගමික චින්තනය දිළිඳු ජනයා තුළ මෙබඳු විශ්වාස ජනිත කරවීමට සමත් විය.

## මහායානයේ බලපෑම

බුද්ධාගම ථේරවාද හා මහායාන යනුවෙන් ප්‍රභේද දෙකක් බවට පත් වීමත් ඒවා ප්‍රශාඛා රැසකට බෙදී යාමත් සිදු වූයේ කනිෂ්ක රජු දවස භාරතයේ පැවැත්වූ දෙවැනි ධර්ම සංගායනාවේ ඓතිහාසික ප්‍රතිඵල ලෙසයි. සංරක්ෂණශීලීන් ලෙස ථෙරවාදීන් හැඳින්වෙන අතර ප්‍රගතිශීලීන් ලෙස පෙනී සිටියේ මහාසාංඝික හෙවත් මහායානිකයන් ය. මහායානිකයෝ නම් බෝධිසත්ත්ව වන්දනාවෙහි සහ මහායාන සූත්‍ර හැදෑරීමෙහි ද යෙදෙන්නෝයි.[29] ලංකාවේ මහායාන බුද්ධාගම ගැන මුල් වරට කරුණු අසන්නට ලැබෙන්නේ වෝහාරිකතිස්ස රජුගේ කාලයේ දී ය. ඒ රජතුමා කපිල නම් ඇමතියා ලවා වෛතුල්‍යවාදීන් පාප නිග්‍රහ කරවා බුදු සසුන බැබළවී යැයි සඳහන් වේ.[30] වෛතුල්‍ය යන්න පාලි වෙතුල්ල ශබ්දයයි. මහායානිකයන්ගේ ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වූ ප්‍රඥා පාරමිතා, සද්ධර්ම පුණ්ඩරික ආදි ධර්ම ග්‍රන්ථවලට සූත්‍රය යන්න සමගින් යෙදෙන පොදු ගෞරවාර්ථවත් නම වූයේ **වෛපුල්‍ය** යන්නයි. වෛතුල්‍ය යනු එහි රූපාන්තරයකි.

මහායානය ලක්දිව ස්ථාපිත කිරීමට අවශ්‍ය දායකත්වය සැපයූ මූලායතනය වූයේ අභයගිරියයි. ලංකාවේ වෛතුල්‍යවාදය ව්‍යාප්ත කිරීමේ නියමුවා වශයෙන් ක්‍රියාකළ සංඝමිත්‍ර නම් භික්ෂුව රාජ්‍ය අනුග්‍රහය ලබමින් මහසෙන් අවධියේ එහි විසීය. මෙකල ලක්දිව ථේරවාදය

කෙතෙක් දුරට අඩපණ වූයේ ද යන්න නිකාය සංග්‍රහය ඉදිරිපත් කරන තොරතුරුවලට අනුව පැහැදිලි වේ.[31] මහා විහාරවාසී භික්ෂූන්ට දන් දුන හොත් ඒ සඳහා ජනයාගෙන් දඩ අය කළේ ය. මහාවිහාරයට අයත් ලෝවාමහාපාය ඇතුළු විහාර සංකීර්ණය මුලින් උදුරා විහාර භූමිය සීසා උඳු වැපිරූ බවක් එහි දැක්වේ.[32] ජයබාහු ධර්මකීර්ති හිමියන්ගේ ආචාර්යපාද වූ ශීලවංශ ධර්මකීර්ති මාහිමියන් **පාරමී මහා සතකය** ලිවීමේ පිනෙන් බුදු බැව් පැතී ය. ඒ අනුව යමින් සද්ධර්මාලංකාර කතුවරයාගේ ප්‍රාර්ථනාව වූයේ ද බුද්ධත්වය ලැබීමයි.

> "මතු බුදුවන බුදුන් දැක අෂ්ට ධර්ම සමෝධානයෙන් යෙදී විවරණ ශ්‍රී ලදින් බුද්ධකාරක ධර්මයන් මුහුකුරුවා ලොවුතුරා බුදුව මුළු ලොවට අභිවෘද්ධි දායක වේම්වා"[33]

මේ ප්‍රාර්ථනාව මධ්‍යකාලීන අවධියේ ලංකාවේ ව්‍යාප්ත වූ මහායාන බුදුදහමේ බලපෑම හේතුවෙන් සිදු වූවකි. කෘතියේ අවස්ථා කිහිපයක ම එය දැකිය හැකියි. සද්ධර්මාලංකාරය රචනා කිරීමේ පින් මහිමයෙන් මෙතේ බුදුන්ගෙන් විවරණ ලබා, දස පාරමී පුරණය කොට, ලොවුතුරා බුදු ව, සසර දුක් නසා අමාමහ නිවන් ලැබේවායි එහි අවසාන භාගයේ දැක්වෙයි.[34] බුදු බව ප්‍රාර්ථනා කිරීම සමාසන්න අවධියේ සාහිත්‍ය කෘතින්හි සුලබව දක්නට ලැබෙන්නකි. දඹදෙණියේ II පරාක්‍රමබාහු රජු ලවා බුදුබව ප්‍රාර්ථනා කරවීමට දේවපතිරාජ අමාත්‍යවරයාගේ ආරාධනයෙන් මයුරපාද පරිවේනාධිපති බුද්ධපුත්‍ර හිමියෝ පූජාවලිය රචනා කළහ. එළුඅත්තනගලු වංශය ද බෝධිසත්ත්ව සංකල්පය ප්‍රකට කරන කෘතියකි.

මතු බුදුවන මෛත්‍රී බෝධිසත්ත්වයන් ගැන සද්ධර්මාලංකාරයේ අවස්ථා කිහිපයක ම දැක්වේ. මෙතේ බෝසත් තුසිත භවනයේ වැඩ වෙසෙමින් ධර්මය දේශනා කරන්නේ ය. එතුමා මතු දවස කේතුමතී රාජධානියේ ඉපිද බුද්ධත්වය සාක්ෂාත් කරන බවත් චූළගල්ල වස්තුවේ සඳහන් වේ.[35] දුට්ඨගාමිණී වස්තුව ආරම්භයේ පැනෙන්නේ කාවන්තිස්ස රජු හා විහාරමහා දේවිය අනාගත මෛත්‍රී බුදුන්ගේ මව්පිය දෙදෙනා වන බවත්, දුටුගැමුණු හා තිස්ස දෙබෑයන් පිළිවෙළින් දකුණත්, වමත් ශ්‍රාවක දෙපළ වන බවත් ය. කාවන්තිස්ස රජුගේ සොයුරිය වූ අනුලාව මෙතේ



බෝසතුන්ගේ අග මෙහෙසිය වන්නී ය. සාලිය කුමරු පිත් වන්නේ ය. සංඝ නම් අමාත්‍යවරයා ප්‍රධාන උපස්ථායකයා ද ඔහුගේ දියණිය ප්‍රධාන උපස්ථායිකාව ද වන්නේ යයි එහි සඳහන් වේ.[36] ලංකා රාජ්‍යය සමෘද්ධිමත් හා ඒකඡත්‍ර වූ කාල වකවානුවක් වන දුටුගැමුණු අවධිය ගැන වඩා උනන්දුවෙන් ලියා තැබූ සද්ධර්මාලංකාර කතුවරයා ඒ අවධියේ විසූ පාලක පක්ෂයේ ප්‍රභූවරුන් තත් අවධියේ පැතිර තිබූ මහායාන සංකල්පවලට අනුගත කොට මෙතේ බෝසතුන්ගේ නෑ පර්ෂද ලෙස උපදින්නේ යැයි ගෙන හැර දැක්වී ය.

ලංකාතිලක සිංහල ලිපියේ මෛත්‍රී, බෝධිසත්ත්ව නමින් ද නාථ, ලෝකේශ්වර නාථ නමින් ද සෙසු දෙවියන්ට පොරොතුව දක්වා ඇත.[37] ලංකාතිලක තඹ තහඩුවේ කියැවෙන පරිදි වඩු රියන් පහක් උස මෛත්‍රී නාථ, ලෝකේශ්වර නාථ රූප දෙකක් නෙළා ඇත.[38] විශේෂයෙන් ගම්පොළ අවධිය වත් ම මෛත්‍රී බෝසත් වන්දනාවත් මතු බුදුවන මෙතේ බුදුන්ගේ ස්වරූපයක් ලෙස සැලකෙන නාථ දේව වන්දනයත් ලංකාවේ ප්‍රචලිත ව පැවතෙන්නට ඇතැයි සිතිය හැකියි.

මේ තත්ත්වයෙන් නොමිදුණු ධර්මකීර්ති හිමියන් මහායාන අදහස් කෙරෙහි භක්තිමත් වූ බව මහායාන ග්‍රන්ථවලින් සිය කෘතියට උකහා ගත් ඇතැම් කථා වස්තුවලින් ද පෙනෙයි.[39] බාහිර නිදානයේ එන ව්‍යාඝ්‍ර ජාතකය මහායාන ග්‍රන්ථ වන ස්වර්ණ ප්‍රභාස, අවදාන කල්පලතා සහ ආර්යශූර පාදයන්ගේ ජාතක මාලාවේ ද ඇතුළත් වේ. හස්තියා ගැන කථාව දිව්‍යාවදානයේ එන්නකි.[40]

මෙත්තෙය්‍ය වස්තුවේ දී මෛත්‍රී සර්වඥයන් දැක ගත නොහැකි ව ඒ කාලයේ අවීචි මහා නරකයේ උපදිනවුන්ගේ ලැයිස්තුවක් එක් කර ඇත.[41] සමාජයේ දුශ්චරිත කරන්නවුන් ඊට අයත් ය. මහායාන සංකල්පවල පිහිටාධාරයෙන් ජනයා දුසිරිතෙන් ඈත් කර තැබීම කතුවරයාගේ අපේක්ෂාව වූ බව පෙනෙයි.

## බමුණු දහම

අතීත ලංකාවේ බ්‍රාහ්මණයන් විසූ බවට පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යික මූලාශ්‍රයයන් මගින් සාක්ෂ්‍ය රැසක් අනාවරණ කර ගෙන ඇත. භික්ෂූන් වහන්සේලාට ගල්ලෙන් පිදූවන් අතර බ්‍රාහ්මණයෝ

ද වෙති. වංශකථාමය පුවත් ඇසුරින් ද මේ බව තහවුරු වෙයි. ජය ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් මෙරටට වැඩම කරවීමේ දී තිවක්ක නම් බමුණුගමින් ඊට පුද සත්කාර කර වූ බවක් සඳහන් වේ.[42] භාරතයේ ප්‍රබල ආගමික සංස්ථාවක් ලෙස ක්‍රියාත්මක වූ බමුණු දහම ලංකාවට ද ව්‍යාප්ත වන්නට ඇත. සද්ධර්මාලංකාරයේ නව වැනි වර්ගය නම් කර ඇත්තේ බ්‍රාහ්මණ වර්ගය නමිනි.

සද්ධර්මාලංකාරයේ එන පහත ඡේදය බ්‍රාහ්මණ ඉගැන්වීමක් වූ චතුරාශ්‍රම ධර්ම සංකල්පයේ සේයා මාත්‍රයක් සිහි කරවයි.

> "එසේ හෙයින් යම් කිසි කෙනෙක් පළමුවන වයස පංචකාමයෙහි ගිජුව නොයෙක් අකුසල් කිරීමෙන් පාපිෂ්ඨව ඇවිද්දාහු වී නමුත් පසුව කාරණාකාරණා දන්නා වයසට පැමිණ යෞවන මදය අරෝග්‍ය මදය ජීවිත මදය යන ත්‍රිවිධ මදාදීන් මත්ව කුසල් කිරීමෙහි ප්‍රමාද වීම සසර දුක් විඳීමට ඒකාන්ත කාරණය'යි නුවණින් සලකා ප්‍රාණාතිපාතය අදත්තාදානය කාම මිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය යනාදී වූ අකුශල ධර්මයන් දුරු කොට ගෘහස්ථ ප්‍රව්‍රජිතාදී වූ ඒ ඒ භාවයට සුදුසු වූ කුශල ක්‍රියාවන් රැස්කළේ වී නම් ..."[43]

එහි දැක්වෙන පළමු වයස, කාරණාකාරණ දන්නා වයස හා ගෘහස්ථ ප්‍රව්‍රජිතාදි වූ ඒ ඒ භාවය යනුවෙන් ජීවිතයේ අවස්ථා කිහිපයක් ඉදිරිපත් වීම චතුරාශ්‍රමධර්ම අතර එන; බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ හා සන්‍යාසි යන අවධි සතරේ අභාසය පෙන්වයි. පුද්ගලයෙකුගේ ජීවිතයේ වයස් මට්ටම් අනුව කළ යුතු කාර්ය පටිපාටියක් දැක්වීම බමුණු දහමේ පසු කාලීන ලක්ෂණයකි.

සුරනිමල යෝධයා ගැන දැක්වෙන ස්ථානයක සෑගිරි සමීපයේ විසූ කුණ්ඩල නම් බමුණෙකු පිළිබඳ සඳහන් වේ. ගැමුණු කුමරා හා මිත්‍ර ව විසූ හෙතෙම ද්‍රවිඩ සංහාරය පිණිස කුමරාට ආධාර කළ බව දැක්වේ. ඒ බමුණා සුරනිමලයන් අත දේශාන්තරයෙන් ගෙනා සඳුන්, සුවඳ කස්තුරි, කපුරු, තුවරලා, පිළි ආදි වස්තුව ගැමුණු කුමරුට ත්‍යාග පිණිස එවී ය.[44] සුඛෝපභෝගී භාණ්ඩ මෙරටට ගෙන්වූවන් අතර බමුණන් ද වූ බව පෙනේ. දුටුගැමුණු රජතුමා සිය ලේලිය වූ අශෝකමාලාවන්ගේ දේහ ලක්ෂණ නිරීක්ෂණය කොට පුණ්‍යශක්තිය



ප්‍රකාශ විමසීමට **සාමුද්‍රිකා ලක්ෂණයෙහි** දක්ෂ වූ බමුණන් ගෙන්වී ය. ස්ත්‍රියක සතු නාරිදේහමය ලක්ෂණ ඇසුරින් ඇගේ චරිත ස්වභාවය හා පුණ්‍ය මහිමය ප්‍රකාශ කිරීමේ හැකියාවක් ඒ බමුණන් සතු ව පැවැතියේ ය.

නාගා නම් ස්ත්‍රියට මණිනාග දිවයින පැවරූ ආකාරය කෘතියේ දැක්වෙන්නේ, "**බමුණන්ට දන් දෙන පරිද්දෙන් ම අතපැන් වත්කොට දන් දී**"[45] යනුවෙනි. උපමා වශයෙන් යොදා ගන්නේ ජනයා දැක හුරුපුරුදු දර්ශනයන් ය. රියහල් තිස්සයන්ගේ ශ්‍රද්ධාව පිරික්සනු වස් ජරපත් බමුණු වේශයක් මවාගෙන ඔරුවට නැඟුණු ශක්‍ර දේවේන්ද්‍රයා ගැන තාත්වික අවස්ථා නිරූපණයක් දැක්වේ.

> "ඉතා මහලු වූ බමුණු වෙසක් මවාගෙන පයිරෙද්ද කර දමා කුඩ මහල්ලක් ඉසට කොටගෙන නැඹුරුව වක ගසාගෙන ආන ආනා සැරයටිය ගස ගසා"[46]

මෙය ජරාවට පත්වූ බමුණකු ඇසින් දැක කරන ලද වර්ණනයක් වැනි ය. කෘතිය රචනා කළ අවධියේ බමුණන් යාචක ස්වරූපයකට සීමා වී සිටි බවක් ඉන් කියැවේ.

## පරිබ්‍රාජක දහම

ඊශ්වර භක්ති ගත් පුද්ගලයෙකු පණ්ඩරංග පරිබ්‍රාජකයෙකුට අග්‍ර දානයක් පිළිගැන්වීමට දරන ලද උත්සාහයක් පණ්ඩරංග වස්තුවේ සඳහන් වේ.[47] මේ පරිබ්‍රාජකයා නුවර සමීපයේ සුසානයක විසී ය. ලෝකය ඊශ්වර නිර්මාණයකැයි පවසන ඊශ්වර භක්ති ඇත්තා වූ පරිබ්‍රාජකයන්ගේ ආගමික ව්‍රත චාරිත්‍රයක් වූයේ සියලඟ අළු තවරා ගැනීමයි. ඔහුගේ ස්වරූප ලෙස ඝන ව වැඩුණු රැවුලින් යුතු වීම, ජටා දැරීම, කිලිටි කන්ථකඩක් පෙරවීම හා පාණි පාත්‍රයෙන් සිඟා කෑම දක්වා ඇත. ඇස් පනාපිට දුටු දේ පරිද්දෙන් මෙකී පරිබ්‍රාජකයාගේ ක්ලිශ්ට ස්වරූපය දක්වා ඇත.

> "ඒ පණ්ඩරංගපරිබ්‍රාජකයා රාත්‍රියෙහි මාගමක හා සමග වාසය කොට උදෑසන ඈ හා සමගම රා බී මත්ව සවස රා හා එක්ව අනුභවයට බිලියක් ගෙන කුඩමස්සන් බා වැලෙක අමුණා බිලිය දියට දමා බිලී ඉපල අල්වාගෙන සිටියේය"

දානය රැගෙන ගිය මනුෂ්‍යයන් දැක ගුණවතෙකු සේ හඟවා සිටිය ද ඔහු වෙතින් පංච දුෂ්චරිතය ම සිදු වූ බව කතුවරයා පවසයි. සද්ධර්මාලංකාරයේ අබෞද්ධ දෘෂ්ටිගත් ආගමිකයන් කර්කශ උපහාසයටත් විවේචනයටත් ලක් කිරීම අඛණ්ඩ ව සිදු ව ඇති හෙයින් මේ සඳහන කෙතෙක් දුරට අපක්ෂපාතී දැයි විමසිය යුතු වෙයි. එහෙත් මින් හැඟෙන්නේ, පරිබ්‍රාජක වේශය ගත්තවුන් ද ලක්දිව වෙසෙමින් සිය පක්ෂයට දායකයන් නැඹුරු කර ගැනීමේ නිරත වූ බවයි.

දානය පිළිබඳ කරන සඳහනක **"දූහැමින් දවස් යවා ගොශිලාදිය රක්නාවූ මනුෂ්‍යයක්හට"**[48] පිරිනැමූ දානය පවා ලක්ෂයක් ජාතියෙහි පස් ලක්ෂයක් විපාක දායකයැ'යි පැවසේ. මෙහි ගෝශිලාදිය යනු ගෝව්‍රතාදියයි. ව්‍රත සමාදන් ව සසරින් මිදීමට උපදෙස් ලැබෙන්නේ පරිබ්‍රාජකයන්ගෙනි. එබඳු තැනැත්තන් ලක්දිව විසූ බව එයින් ද පෙනේ.

## ශිව ආගම

ලක්දිව ශිවලිංග වන්දනය පැවති බවට සාධක ඇත. පණ්ඩුකාභය රජු තැනවූ සිවිකාශාලා නම් ගොඩනැගිල්ල ශිවලිංග පූජාව සඳහා භාවිත වී යැයි අදහසකි. මහාවංස ටීකාකරුට අනුව එය ශිවලිංග ශාලාවක් හෝ ප්‍රසූතිඝරයකි.

කාවීරපට්ටන වස්තුවේ මහේශ්වර භක්ති ගත්තවුන් මිථ්‍යාදෘෂ්ටිකයන් ලෙස හඳුන්වා ඇත. වරින්වර සිදු වූ ද්‍රවිඩ ආක්‍රමණ හේතුවෙන් ලංකාවට පැමිණි දෙමළ සේනාවන් සමග ඊශ්වර වන්දනය ද පැමිණෙන්නට ඇත. කෘතියේ ඒ ගැන අපහාසාත්මක දෘෂ්ටියෙන් වුව තොරතුරු දක්වෙන්නේ එය ක්‍රමවත් ආගමික සංස්ථාවක් වශයෙන් මෙහි පැවතීම හේතුවෙනි. සද්ධර්මාලංකාරයේ පාදපීඨිකා වස්තුවේ ශිව හෙවත් මහේශ්වර දේවයාගේ වික්‍රමයන් රැසක් ප්‍රකාශ වෙයි. ගුණ වෙසින් නුගුණ පවසන එම සඳහන උත්ප්‍රාසාත්මක ස්වරූපයක් දරන්නකි. **"ඊශ්වරයන්ගේ නුගුණම ගුණයයි ගෙන වර්ණනා කොට දක්වීය"**යි එහි සඳහන් කර ඇත.



## සෙසු අභිචාර හා පුදපූජා

### 1. ස්වභාවික වස්තු වන්දනය

ප්‍රාග් මහින්ද යුගයේ මෙහි පැවතියේ සම්මිශ්‍රණය වූ අපැහැදිලි ආගමික තත්ත්වයකි. විවිධ ජන කොටස් නොයෙක් ප්‍රාථමික ආගමික විශ්වාස ඇති ව කල් ගෙවූහ. ඉර, හඳ, තාරකා, ගස් ගල්, පර්වත ආදි ස්වභාවික වස්තූන්ට දේවත්වයක් ආරෝපණය කරමින් වැඳුම්පිදුම් කිරීම එහි දී සිදු ව ඇත. ස්වභාවික ලෝකයේ පවතින අචේතනික වස්තූන් කෙරෙන් තමන්ට යහපත, අයහපත ළඟා වන බව සිතූ පැරැන්නෝ එකී වස්තූන් නැමදීමට හුරු වූහ. මහින්දාගමනයෙන් පසුව මෙබඳු අතාත්වික වන්දනයන් හේතු ප්‍රත්‍යයකට අනුව හැඩගැස්විණි.[49]

ලාංකේය බුදුසමයේ පවත්නා බෝධි වන්දනය, ස්තූප වන්දනය ආදිය හඳුනා ගැනෙන්නේ ප්‍රාග් මහින්ද කාලයේ ජන විඥ්ඥාණගත ව පැවැති ප්‍රාථමික සංකල්පවල සහේතුක සංවර්ධනීය අංග හැටියටයි. පාරිභාරික ලක් බුදු සමයට එබඳු ප්‍රාථමික සංකල්පයන් සහානුබද්ධ කර ගැනීම ගැන භාතිය රජ දවස සිදු වුයේ යැයි කියන පුවතකින් ද පැවසෙයි. රාජ නියෝගයෙන් ධර්මාසනාරූඪ වූ ධර්මකීර්ති නම් පිඩිවරයාණෝ දහම් දෙසීමට මත්තෙන්;

දිවා තපති ආදිච්චෝ - රත්තිං අභාති චන්දිමා
සන්නද්ධෝ ඛත්තියෝ තපති - ඣායී තපති බ්‍රාහ්මණෝ
අථ සබ්බ මහෝරත්තං - බුද්ධෝ තපති තේජසා[50]

යන ගාථාව දේශනා කළහ. එයින් අස්තංගත වන්නා වූ සූර්ය මණ්ඩලයට හා උදාවන චන්ද්‍ර බිම්බයට පළමු ව නමස්කාර කෙරිණි. ඉර, හඳ, වන්දනා කිරීමේ ප්‍රාග් බෞද්ධ ඇදහිල්ල චාරිත්‍ර ධර්මයක් වශයෙන් නොනසා පවත්වාගෙන ඒම එයින් පෙනෙයි.

### 2. දේව වන්දනය

මහාවංසයට අනුව ලක්දිව බුදුසසුන පිහිටන බැවින් විජය ඇතුළු පිරිස සුරකින ලෙස පිරිනිවන් මංචකයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයාට පවසා සිටියහ. ඔහුගේ නියමයෙන් උත්පලවණ්ණ දිව්‍යරාජයා ලක් බුදුසසුන සුරකින බව එහි දක්වේ.[51] ගම්පොළ කාලය දේව වන්දනය පිළිබඳ ඉතිහාසයට එක් වන එක් සුවිශේෂ අවධියකි. විහාරස්ථානවල වෙන ම ගෘහයක තනා තිබූ

දේව ප්‍රතිමා බුදු කුටිය තුළට ම පැමිණීම මුල් වරට මෙකල සිදු විය. ගඩලාදෙණි සිංහල ලිපියට අනුව ගඩලාදෙණිය විහාරයේ ආරක්ෂාව උදෙසා දේවාලය විහාරය තුළට රැගෙන ආ බව පැවසේ.

> "විහාරයට ආරක්ෂාවකුත් උව මැනැවැයි දෙව්රජ ගෙයකුත් කරවා"[52]

මිහිඳු මාහිමියන් ලක්වැසි පොදු මහජනයාට දහම් දෙසීමේ දී විමානවත්ථු, ප්‍රේතවත්ථු යොදා ගත් අතර විමානවත්ථුවේ කියැවෙන්නේ මිය පරලොව ගොස් දිව්‍ය විමාන ලැබූවන් පිළිබඳව ය. දේව යනුවෙන් ජන ගෝත්‍රයක් ද විය. දේව ඇදහිල්ල හා එකී ජන කොට්ඨාසය අතර සබඳතාවක් වූ බවක් නොපෙනේ.

අධිගෘහිත දෙවි දේවතාවුන් පිළිබඳ දැඩි විශ්වාසයක් විය. රජුගේ ඡත්‍රයට අධිගෘහිත ව දේවතා දුවක විසූ බව පැවසේ.[53] උම්මග්ග ජාතකයේ ද රජුගේ දළ පුඩු සේසතෙහි වසන දේවතා දුවක ගැන සඳහන් වේ. නිධානයන්ට අධිපති දෙවියන් විසුහ'යි විශ්වාසයක් පැවති බව උත්තරෝලිය වස්තුවෙන් හෙළි වේ.

**3. යක්ෂ විශ්වාස**

යක්ෂයන්ගෙන් උවදුරු ඇති වූ බව පැවසෙයි. මහාවංසයේ කුවේණිය හඳුන්වා ඇත්තේ ද යක්ෂණියක වශයෙනි. ආර්යයාගමනයට පෙර ලක්දිව, යක්ෂාධිගෘහිත පුරයක් ලෙස පැවති බව එහි සඳහන් වේ.

> යක්ෂ රාජක්ෂසාදීන්ට බුද්ධ යන වචනය පවා බිය එළවයි. බුද්ධ යන වචනය ඇසූ සැණින් යක්ෂයෝ භය ගෙන පළායන්නාහුමය[54]

යනුවෙන් ඒ බව සද්ධර්මාලංකාරයේ දැක්වේ. පණ්ඩුකාභය සමයේ මහේජ, වලවාමුඛී නමැති යක්ෂ යක්ෂණියෝ පුජාර්හ වුහ.[55] චිත්තරාජ යක්ෂයා සමග හෙතෙම දෙව්, මිනිස් නැටුම් නැරඹී ය. ජුතින්දර නම් යකුගෙන් රෝග පීඩා වැළඳුණු බවට ද විශ්වාසයක් විය. මිහිඳු මාහිමි පළමු වතාවට දුටු දෙවනපෑතිස් රජු **"මේ මනුෂ්‍යයෙක් දෝ හෝ යි අමනුෂ්‍යයෙක් දෝ හෝයි"** සිතී ය. ලක්දිව අබුද්ධෝත්පාද කාලයේ යක්ෂයන්ට ම නිවාස වන බවක් සද්ධර්මාලංකාරයේ සඳහන් වේ.[56]



අමනුෂ්‍ය භීතිය පැවැති බැව් ආරඤ්ඤක අභය ස්ථවිර වස්තුවෙන් ද පෙනෙයි. ගෝඨයිම්බරයා හා යුද කළේ ජයසේන නම් යක්ෂයෙකි.

**4. නාග වන්දනය**

කාංචනදේවී වස්තුවේ දිව්‍ය නාගරාජයෙක් බණ පිරිස් කෙළවර සිටි රූමත් යෞවනියක කෙරේ පිළිබඳ සිත් පහළ කොට ඇය තමන් සතු කර ගනු රිසින් සියලඟ වෙළා ගත්තේ ය. නාගයින් අතීත ලාංකේය සමාජයේ වන්දනීය සත්ත්ව කොට්ඨාසයකි. නාග නමින් හැඳින්වූ මනුෂ්‍ය ගෝත්‍රයක් ද පැවතියේ ය. පුරාවිද්‍යාමක කැණීම්වලට අනුව වැව් ආදි වාරි කර්මාන්ත ආශ්‍රයෙන් හමු වී ඇති නාග රූපවලින් පෙනී යන්නේ නාගයින් ජලය හා ජල මූලාශ්‍රය සම්බන්ධ අධිකාරීත්වය දැරූ පිරිසක් විය හැකි බවයි. එමෙන් ම නාග වන්දනය පිළිබඳ ව ද ඉන් ඉඟි සැපයෙයි. චූලෝදර, මහෝදර නා රජුන් දෙදෙනාගේ යුද්ධයක් සංසිඳවීම පිණිස ගෞතම බුදුන් වහන්සේ ලංකාවට වැඩම කළ බව දැක්වේ.[57] වඩුනාගල විසූ දිව්‍යනාගයින් ගැන නාගාවස්තුවේ එයි. උරග නාග ස්වරූපයත්, දේව නාග ස්වරූපයත් යන ස්වරූප දෙක ම ඉසිලිය හැකි නාගයන් ගැන වූ විශ්වාසය මත නාග ඇදහිල්ල ක්‍රියාත්මක වන්නට ඇත.

මධ්‍යකාලීන අවධියට අයත් දේශීය සමාජ ලක්ෂණ රැසක් විද්‍යමාන වන සද්ධර්මාලංකාරය ඇසුරු කරමින් එහි එන කතා පුවත්වලින් දිස් වන පැරණි ලංකාවේ ආගමික ස්වරූපය ඉහත අධ්‍යයනයේ දී අපගේ අවධානයට ලක් විය. එහි දී අනාවරණය වූයේ බුදුසමය ප්‍රධාන කර ගත් පාරිහාරික ලක්ෂණ මෙන් ම වෙනත් ආගම් ද ලංකාවේ ක්‍රියාකාරී තත්ත්වයේ පැවැති බවකි.

**ආන්තික සටහන්:**

1 අබයරත්න, හරිස්චන්ද්‍ර. ගම්පොළ යුගය. (2009). පි 64
2 මහාවංසය (සිංහල. පරි), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පි 02, 03
3 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 329
4 එම. පි 16
5 එම. පි 15
6 එම. පි 13
7 එම. පි 304
8 එම. පි 19
9 එම. පි 683

10 සුරවීර, ඒ.වී. අනුරාධපුර සමාජය. (2009) පි 83
11 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 28
12 එම. පි 7
13 එම. පි 437
14 මහාවංසය (සිංහල. පරි), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පි 148
15 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 20
16 එම. පි 378
17 එම. පි 486
18 එම. පි 501
19 වික්‍රමසිංහ, මාර්ටින්. සිංහල සාහිත්‍යයේ නැඟීම. (1959) පි 177
20 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 139
21 එම. පි 268
22 එම. පි 620
23 වික්‍රමසිංහ, මාර්ටින්. සිංහල සාහිත්‍යයේ නැඟීම (1959). පි 178
24 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 155
25 එම. පි 6
26 එම. පි 578
27 එම. පි 567
28 එම. පි 536, 537
29 ලං.වි.ලං.ඉ. I පි 194
30 එම. පි 241
31 නිකාය සංග්‍රහය. (1997). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. පි 17, 18
32 එම. පි 17
33 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 30
34 එම. පි 701
35 එම. පි 669
36 එම. පි 460
37 අබයරත්න, හරිස්චන්ද්‍ර. ගම්පොළ යුගය. (2009) පි 190
38 එම
39 විජේනායක, ඇන් කේ. සිරිසේන.සිංහල ගද්‍ය සාහිත්‍ය විචාරය. (1965) පි 49
40 අබයරත්න, හරිස්චන්ද්‍ර. ගම්පොළ යුගය. (2009) පි. 192
41 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 728
42 මහාවංසය (සිංහල. පරි), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පි 82
43 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 396
44 එම. පි 467
45 එම. පි 410
46 එම. පි 564
47 එම. පි 648
48 එම. පි 12
49 බෞද්ධ ධර්මාචාර්ය විභාගය, බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය. (2006) පි 73



50 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 28
51 මහාවංසය (සිංහල. පරි), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පි 4
52 EZ. Vol. iv No. 12 pp. 90-110
53 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 621-523
54 එම. පි 212, 213
55 මහාවංසය (සිංහල. පරි), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පි 46
56 සද්ධර්මාලංකාරය, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම. පි 368
57 එම. පි 373

## ආශ්‍රිත ග්‍රන්ථ:

### සිංහල:


අබයරත්න, හරිස්චන්ද්‍ර, (2009), **ගම්පොළ යුගය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

කුලසූරිය, ආනන්ද, (1997), **සිංහල සාහිත්‍යය-4**, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

ගොඩකුඹුර. සී. ඊ. (1999), **සිංහල සාහිත්‍යය**, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

ජයවර්ධන, ඩබ්ලිව්. ඒ. (1964), **පුරාතන ලංකාව**, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

තිලකසිරි, සිරි, (2004), **සාහිත්‍ය අටුවාව-ගම්පොළ සාහිත්‍යය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

**නිකාය සංග්‍රහය**, (1997), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්), දෙහිවල.

බුද්ධදත්ත මහා ස්ථවිර, පොල්වත්තේ ශ්‍රී, (1951), **අටුවා පරීක්ෂණය හා අටුවා කථා වස්තු**, විද්‍යාලංකාර මුද්‍රණාලය, පෑලියගොඩ.

**රසවාහිනී වනරතන ව්‍යාඛ්‍යා - ජම්බුද්දීපුත්පත්ති කථා**, ධම්මසොණ්ඩක වග්ගෝ, (1993), සමයවර්ධන පොත් සමාගම, කොළඹ 10.

බෞද්ධ ධර්මාචාර්ය විභාගය - **බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය**, (2006), බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

**සද්ධර්මාලංකාරය**, (1971), පියරතන නායක ස්ථවිර, මකුළුදූවේ ශ්‍රී (සංස්), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

**ලංකා විශ්වවිද්‍යාලය -සංක්ෂිප්ත ලංකා ඉතිහාසය**, (2004), නිකොලොස්. සී.ඩබ්ලිව්, පරණවිතාන. ඇස්, සමන් ප්‍රකාශකයෝ, නුගේගොඩ.

වික්‍රමසිංහ, මාර්ටින්, (1959), **සිංහල සාහිත්‍යයේ නැඟීම**, සමන් මුද්‍රණාලය, මහරගම.

රෝහණදීර, මැන්දිස්, (1996), **ශ්‍රී ලංකාවේ මහාසාමි සංඝරාජ පරපුර**, දීපානි ප්‍රකාශන, නුගේගොඩ.

**සද්ධර්මාලංකාරය**, (2000), ප්‍රාචීන භාෂෝපකාර සමාගම (සංස්), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

**සද්ධර්මාලංකාරය**, (1997), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්), දෙහිවල.

සන්නස්ගල, පුඤ්ඤවිබණ්ඩාර, (1961), **සිංහල සාහිත්‍ය වංශය**, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති, (1971), **මධ්‍යතන ලංකාව**, සුප්‍රා මුද්‍රණ ශිල්පියෝ, පේරාදෙණිය.

සුරවීර, ඒ. වී, (2002), **අනුරාධපුර සංස්කෘතිය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

සිරිසේන විජේනායක, ඇන්. කේ, (1965), **සිංහල ගද්‍ය සාහිත්‍ය විචාරය**, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

සුරවීර, ඒ. වී, (2009), **අනුරාධපුර සමාජය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

**සඟරා:**

**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය- I කාණ්ඩය, I භාගය**, (1964), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය සිංහල පරිවර්තනය (සංස්), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය.

**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය- I කාණ්ඩය, II භාගය**, (1972), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය සිංහල පරිවර්තනය (සංස්), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය.

**සාහිත්‍ය මණ්ඩලීය ලිපි මාලා අංක 01 - ලංකා ඉතිහාසය**, (1967), පරණවිතාන, මහාචාර්ය සෙනරත්, නිකොලොස්. සී.ඩබ්ලිව්, මැන්දිස්, ආචාර්ය. ජී. සී, ගුණවර්ධන, වාසලමුදලි. ඩබ්ලිව්. ඇෆ්, හූල්ෂ්. ඊ, කොඩ්රිංටන්. එච්. ඩබ්ලිව්, ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩල ප්‍රකාශන, කොළඹ.

**ඉංග්‍රීසි:**

**Epigraphia Zeylanica**, Vols.

# භාෂා පරිවර්තනය පිළිබඳ ඇලෙක්සැණ්ඩර් ෆ්‍රාසර් ටයිට්ලර් සංකල්පය

**ජයමල් ද සිල්වා**

Attempts to establish a theory of translation date back to the era of the Latin Poet Horace (65 BC - 8 BC) who asserted in his poem Ars Poetica (c. 10 BC) that the poet who resorts to translation should avoid a certain operation namely, word-for word rendering - in order to write distinctive poetry. Since then, many theorists have attempted to formulate their own theories of translation, though many of them were mere repetitions of the theories presented by previous theorists. Etienne Dolet, George Chapman, John Denham, Abraham Cowley, and John Dryden are considered pioneer theorists whose contribution to the field of translation theory is still considered unique. Towards the end of the eighteenth century, in 1791, Alexander Fraser Tytler (1747 - 1813) published. The Principles of Translation', which is considered the first systematic study in English on the translation processes. In this treatise Tytler sets up three basic principles which should be followed in order to produce a faithful translation. This paper is an examination of Tytler's concept on translation as manifest in his treatise.

දහ අට වැනි සිය වසේ භාෂා පරිවර්තන න්‍යායවේදීන් අතර ඇලෙක්සැණ්ඩර් ෆ්‍රාසර් ටයිට්ලර් (1747-1813) සුවිශේෂ ස්ථානයක් හිමි කර-ගනී. 'භාෂා පරිවර්තන මූල ධර්ම' (The Principles of Translation) යනුවෙන් 1791 වසරේ දී ඔහු ඉදිරි පත් කළ නිබන්ධය හේතුවෙන් තත් කාලීන භාෂා පරිවර්තන ක්ෂේත්‍රය නව දිශානතියක් කරා යොමු විය. භාෂා පරිවර්තනය හා භාෂා පරිවර්තන න්‍යාය

© **කථිකාචාර්ය ජයමල් ද සිල්වා**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය